දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

DISTANCE AND CONTINUNING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය - 2016

විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ මාලාව

ඉ.ප්‍ර.1.1 - ලංකා ඉතිහාසය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කංචන ජනප්‍රිය kanchanajanapriya@yahoo.com
ඉතිහාස අධ්‍යයනාංශය

## රජරට ශිෂ්ටාචාරය හැඩගැස්වීමෙහිලා මෙරට භූගෝලීය සාධක බලපෑ ආකාරය

වරායන් :-

- රජරට ශිෂ්ටාචාරය හැඩගැස්වීමට මහාතිත්ථ, ගෝකණ්ණතිත්ථ, දඹකොළ පටුන, ගොඩවාය සූකරතිත්ථ වරායන් වැදගත් විය. ඉන් ද මහා තිත්ථ වරායට වැදගත් තැනක් හිමි වේ.
- මෙරට ආර්යය ජනාවාසකරණයට වරායන් හේතු වූ බවත්, රජරට ශිෂ්ටාචාරයේ හැඩ ගැස්මට එය හේතු වූ බවත්
- ස්වභාවික වරායන් හේතුකොටගෙන සංක්‍රමණ මෙන්ම ආක්‍රමණ ද ඇති වූ බව දකුණු ඉන්දියන් ආක්‍රමණ බොහොමයක් මහාතිත්ථවරාය හරහා සිදු වූ බව.
- සේන ගුත්තික, එළාර, භල්ලුක සෙනවියා චෝල ආක්‍රමණ මීට නිදසුන් බව.
- I වන විජයබාහු චෝලයන්ට එරෙහි සටනේදී මහාතිත්ථ වරායේ සේනාවක් නතර කිරීමෙන් අපේක්ෂා කළේ අතිරේක සේනා පැමිණීම වැළැක්වීමයි.
- ආර්ථික වශයෙන්ද මෙම වරායන් රජරට ශිෂ්ටාචාරය හැඩගැස්වීමෙහිලා බලපා ඇත. වෙළඳාම සඳහා පෙරඅපර දෙදිග වෙළඳුන් මෙරටට පැමිණීම ස්වාභාවික වරායන් හරහා සිදු විය.
- මෙරට පාලකයන් තම භාණ්ඩාගාර ශක්තිමත් කිරීමට ස්වභාවික වරායයන් භාවිතා කළේය. වරායන්ට පැමිණි විදේශික වෙළඳුන්ගෙන් බදු අය කරමින් භාණ්ඩාගාර තර කළ බව ගොඩවාය ,නයිනතිව් ,දෙවුන්දර සෙල්ලිපි සනාථකරයි.
- සංස්කෘතික ඉතිහාසය හැඩ හැඩගැස්වීමට දඹකොළපටුන වැනි වරායන් මහෝපකාරී විය. බුදුදහම මෙරටට ලැබීම, ජය ශ්‍රී මහා බෝධි අංකුරයට මෙරටට වැඩම කිරීම, පත්තිනි දෙවියන්ගේ සළඹ මෙරටට ගෙන ඒම (මහා තිත්ථ) ශිල්ප ශ්‍රේණි 18 පැමිණීම වැනි සංස්කෘතික හේතු රැසකට තුඩු දුන්නේ මෙරට ස්වභාවික වරායන්ය.

මධ්‍යම කඳුකරය :-

- ඈත අතීතයේදී මෙය මලය රට නමින් හඳුන්වනු ලැබීය.
- ඇතැම් අවස්ථාවලදී එය රජරට පාලකයන්ගේ ග්‍රහණයට හසු නොවූ ප්‍රදේශයක් ලෙස දැක්විය හැක.
- ජල දුර්ග, වන දුර්ග, ගිරි දුර්ග වලින් සමන්විත වූ මධ්‍ය කඳුකරය ආරක්ෂිත ස්ථානයක් වන්නේය.

- ගැමුණු කුමරු කෙරෙහි කාවන්තිස්ස පිය රජු කෝප වූ අවස්ථාවේ ගැමුණු කුමරු ආරක්ෂාව පතා ගියේද මධ්‍යම කඳුකරයටයි. එසේම සත් ද්‍රවිඩ ආක්‍රමණය ඇති වූ අවස්ථාවේදී වලගම්බා රජු ආරක්ෂාව පතා ගියේද මධ්‍ය කඳුකරයටයි. රජ වීමට පෙර කිත්තිකුමරු (I වන විජයබාහු) කෙටි කලක් මධ්‍ය කඳුකරයේ විසීය.
- රටේ අභ්‍යන්තර යුද්ධ ඇති වූ අවස්ථාවලදී ඒවායින් පරාජය ලැබූ කැරලි නායකයින්ද යම් යම් අපරාධ නිසා රජුගේ උදහසට ලක් වූ රාජ කුමාරවරුන්ද ආරක්ෂාව පතා ගියේ මධ්‍ය කඳුකරයයටයි. මෙසේ මධ්‍ය කඳුකරය නිසා මුළු රටම ආක්‍රමණිකයන්ට අල්ලා ගැනීම අපහසු විය.

ගංගා පද්ධතිය :-

- මෙරටට පැමිණි ආර්යය සංක්‍රමණිකයන් ගංගා ඇසුරු කරගෙන ජනාවාස පිහිටුවා ගත්හ.
- අනුරාධගම, උපතිස්සගම, උරුවේලගම, උදේනිගම මෙන්ම කැළණියේ හා රුහුණේ ද ජනාවාස ඇතිවූයේ ගංගා ආශ්‍රිතවය. අනුරාධපුර, පොලොන්නරු රාජධානි හෙවත් අගනුවරවල් බිහි වූයේද ගංගාවල් අසලය.
- එසේම රජරට ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ වී ගොවිතැනයි, වියළි කාලගුණයකින් සමන්විත වූ රජරට ජන සංඛ්‍යාව වැඩිවත්ම ගංගා ජලය ප්‍රමාණවත් නොවූයෙන් ඒ සඳහා ජල සම්පාදන ක්‍රම අවශ්‍ය විය.
- එසේම රජරට අවධියේ මෙරට දේශසීමා වෙන්කිරීම ද සිදුවූයේ ගංගා ආශ්‍රිතවය. එමගින් පරිපාලනය පහසු විය. රුහුණු, මායා, පිහිටි යන පරිපාලන ඒකකවල සීමා වූයේ ගංගාවල්ය. පොලොන්නරු යුගයේදී වලවේ ගඟේ සිට බෙන්තර ගඟ දක්වා කොටස දොළොස් දහස් රට ලෙසත්, මහවැලි ගඟේ සිට වලවේ ගඟ දක්වා කොටස අට දහස් රට ලෙසත් හැඳින්විණි..
- රජරට රාජධානි සමයේ ගංගා මුවදොරවල් හා තොටුපොලවල් ආශ්‍රිතව වෙළඳ මධ්‍යස්ථාන ද බිහි විය.

තැනිතලා ප්‍රදේශ :-

- ලංකාවේ මුල්ම ජනාවාස බිහිවූයේ තැනිතලා ප්‍රදේශ ඇසුරිනි. ඊට හේතුව ඔවුන්ගේ ජීවනෝපාය මාර්ගය සාර්ථකව කරගෙන යාමට සුදුසු පරිසරයක් එහි තිබීම නිසාය.
- වී ගොවිතැන මෙන්ම, සත්ව පාලනය කරගෙන යාමට මේ තැනිතලා ප්‍රදේශ උපකාරි විය. එසේම වර්ෂා ජලය ප්‍රමාණවත් නොවූ නිසා වාරිකර්මාන්තය මුල් කොටගත් ආර්ථික රටාවක් බිහිවිය. එසේම උතුරුදිග හා ගිණිකොණ දිග තැනිතලා ප්‍රදේශ කේන්ද්‍ර කොටගෙන ජනාවාස ව්‍යාප්තවීම හා රාජධානි ව්‍යාප්තවීම දක්නට ලැබේ.

**කාවන්තිස්ස හා දුටුගැමුණු රජවරුන්ගේ දේශපාලන කාර්ය සංසිද්ධීන්හි සමාන අසමානතා**

**(i) ඔවුන් මුහුණ පෑ අභියෝග** **(ii) දිවයින එක්සත් කිරීම**

- මහානාග යුව රජු පරපුරෙන් බිහිවන රුහුණේ මාගම පරම්පරාව තුල කාවන්තිස්ස රජුගේ භූමිකාව
- රුහුණේ මාගම පාලකයා ලෙස කටයුතු කරන සමයේ චෝල දේශයෙන් පැමිණි එළාර අනුරාධපුරය ආක්‍රමණය කොට රජරට පාලකයා බවට පත් වේ.
- කාවන්තිස්ස රජු එළාරගෙන් රුහුණට එල්ල විය හැකි අභියෝග වලට මුහුණ දීමට ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත.
    - රුහුණ එක්සත් කිරීම
    - යුද හමුදා සකස් කිරීම හා ආයුධ නිෂ්පාදනය
    - ආර්ථික සංවර්ධනය
    - දීඝාමඩුල්ල ප්‍රදේශයේ හා කසාතොට ආරක්ෂක සංවිධානය
    - ශාසනයට කළ අනුග්‍රහය
    - සිය පුතුන් වන ගැමුණු හා තිස්ස යන අයගේ සමඟිය ඇති කිරීමට කටයුතු කිරීම.
- ඉහත සඳහන් කාර්ය සංසිද්ධීන් දුටුගැමුණු රජුට එළාරගේ ආධිපත්‍යයෙන් රජරට මුදවාගෙන දිවයින එක්සත් කිරීමට පදනම විය.
- මාගම බලය තහවුරු කර ගැනීම පිළිබඳ දුටුගැමුණු අභියෝග සාකච්ඡාවට ලක් කර සේනා සංවිධානය පිළිබඳව තොරතුරු විග්‍රහ කල යුතුය.
- මෙලෙස සංවිධානය වීමෙන් පසු මහාවංශයෙහි සඳහන් වන අන්දමට "මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව බුදු දහමේ චිරස්ථිතිය සඳහා " බව ප්‍රකාශ කිරීම.
- දුටුගැමුණු අභය රජුගේ යුධ ගමන් මග ප්‍රධාන සංධිස්ථාන (මහියංගනය, කසාතොට, මහේල නගර, විජිතපුරය ආදී ) විග්‍රහ කිරීම මෙන්ම රෝහණ දේශවාසීන්ගෙන්, භික්ෂූන්ගෙන් ලද දායකත්වය විග්‍රහ කිරීම වැදගත් වේ.
- මහියංගනයේ සිට විජිතපුරය දක්වා තිබූ එළාරගේ බලකොටු ජය ගැනීම අනුගමනය කළ උපක්‍රමශීලී යුධ උපායමාර්ග විග්‍රහ කිරීම වැදගත් වේ.
- දුටුගැමුණු රජුගේ යුද්ධමය කාර්ය සංසිද්ධීන්හි වැදගත්මක හා භල්ලුක සමග පැවති දෙවන යුද්ධය පිළිබඳව මෙහිදී කරුණු සාකච්ඡා කිරීම වැදගත් වේ.
- ප්‍රථම වරට දිවයින එක්සේසත් කොට ආගමික හා සංස්කෘතික වශයෙන් සිදුකරන ලද ඓතිහාසික කාර්ය භාරය විග්‍රහ කිරීම වැදගත් වේ.

# ලංකාවේ ඉතිහාසය හැදෑරීමට උපකාරීවන මූලාශ්‍ර


රුහුණ විශ්ව විද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කංචන ජනප්‍රිය


- ✓ ලංකාවේ පැරණි ඉතිහාසය හැදෑරීම සඳහා සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර යනුවෙන් මූලාශ්‍ර වර්ග 2ක් අපට උපයෝගී වේ. එම මූලාශ්‍ර උපයෝගී කරගෙන මෙරට පැරණි ඉතිහාසය ගොඩනගා ඇත.
- ✓ ඉතිහාසය යනු අතීත මිනිස් ක්‍රියාකාරකම් හදාරන විෂයකි.

## සාහිත්‍ය මූලාශ්‍ර

- **දීප වංශය** → මෙරටින් හමුවන පැරණිතම ග්‍රන්ථයයි (ක්‍රි.ව4c) → භික්ෂුණීන් විසින් රචිත යැයි විශ්වාස කෙරේ
- **මහාවංශය** → මෙරට අඛණ්ඩ ලිඛිත ඉතිහාසය ගොඩනැගීමට උපකාරී වේ. → දික්සඳ සෙනෙවි පිරිවෙනේ මහානාම හිමියන් රචිතය
  - (දීප වංශය හා මහාවංශය) → මහසෙන් රාජ්‍ය සමය දක්වා තොරතුරු ඇතුලත්ය. (ක්‍රි.ව.5-6c)
  - (සීහලට්ඨකථා මහාවංශය, උත්තර විහාරට්ඨ කථා) විනයට්ඨ කථා, උපයෝගී කරගෙන ඇත
- **මහාවංශටීකාව හෙවත් වංසත්ථප්පකාසිනිය** → මහාවංශයේ අර්ථ විවරණය සඳහා පසුකාලීනව පාලි භාෂාවෙන් රචිතය. (4c පසුව)
- **දාඨාවංශය** → දළදා සම්දුන්ගේ ඉතිහාසය දැක්වේ.
- **ථූපවංශය** → ස්ථූප විහාරාරාම පිළිබඳ විස්තර ඇතුළත්ය
- **බෝධි වංශය** → ජය ශ්‍රී මහා බෝ සම්දුන්ගේ ඉතිහාසය සඳහන් වේ.
- **පූජාවලිය, සද්ධර්මලංකාරය** → රජරට ශිෂ්ටාචාරයේ තොරතුරු හෙළි කරයි.
- **නිකාය සංග්‍රහය, රාජාවලිය** → ගම්පොල සිට කෝට්ටේ දක්වා තොරතුරු හෙළිකරයි
- **සංදේශ කාව්‍ය; ප්‍රශස්ති කාව්‍ය (පැරකුම්බා සිරිත); හටන් කවි (සීතාවක හටන කොන්ස්තන්තිනු හටන, ඉංග්‍රීසි හටන)** → කෝට්ටේ සිට මහනුවර යුගය දක්වා තොරතුරු හෙළි කරයි

## දේශිය සාහිත්‍ය මූලාශ්‍ර යොදාගැනීමේදී සැලකිල්ල යොමු කළ යුතු කරුණු

- මූලාශ්‍රය රචනා වූ කාලය
- මූලාශ්‍රයේ කතුවරයා
- කතුවරයාගේ අරමුණු
- මූලාශ්‍රයට කරුණු සපයාගත් ආකාරය

# පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර

## සෙල්ලිපි

ලංකාවේ සෙල්ලිපි පටන් ගැනීම මෙරටට බුදුදහම හඳුන්වාදුන් වකවානුව දක්වා දිව යයි. බුදු දහම හඳුන්වාදීමට පෙර ලේඛන කලාවක් වූයේද නැද්ද යන්න පිළිබඳ මතභේද වේ. වංශකථාවේ එන තොරතුරු වලින් පෙනී යන්නේ සමාජයේ ඉහල ස්ථරවලට අයත් පුද්ගලයින් ලිවීම කියවීම දැන සිටි බවයි. විජය විසින් හසුන්පත් යැවීම පණ්ඩුකාභය කථා ප්‍රවෘත්තියේ එන උන්මාද චිත්‍රා හා දීඝගාමිණී අතර පෙම්පත් හුවමාරුව, පණ්ඩුල බ්‍රාහ්මණයා විසින් පණ්ඩුකාභය කුමරුට අකුරු ඉගැන්වීම, මගින් පෙනී යන්නේ ලිවීම, කියවීම දත් පිරිසක් සුළු වශයෙන් හෝ බුද්ධාගමට පෙර සිටම සිට ඇති බවයි. ඉන් මෙරට දියුණු ලේඛන කලාවක් පැවති බව පැවසිය නොහැක. ඉහත සඳහන් කල අයගෙන් සමහර පුද්ගලයන් ඉන්දියාවෙන් පැවත එන අයයි. ඔවුන් තම මව්බිමේ පැවති ලිවීමේ ක්‍රම අනුගමනය කළා යැයි සිතිය හැකිය. නමුත් යම් කිසි සාහිත්‍යයක් ගොඩ නැගීමට තේමාවක් පදනමක් තිබිය යුතුය. එවැනි පදනමක් ලැබුණේ බුදු දහම හඳුන්වා දීමත් සමඟය. විශේෂයෙන් බුදු දහම හඳුන්වා දුන් සෑම රටකම පැහැදිලිව ඇති වූ දියුණුවකි. සාක්ෂරතාව ඉක්මනින් පැතිර යාම බුදු දහම පැතිරයාමේ විශේෂම ලක්ෂණය නම් සාමාන්‍ය ජනතාව අතර අධ්‍යාපනය පැතිර යාමය. තමන් පවසන දෙන අකුරු මගින් ලිවීමෙන් ඉගැන්වීමත් බෞද්ධ අධ්‍යාපනයේ එක් පිළිවෙලකි.

## ලෙන් ලිපි

මුල් කාලයට අයත් බ්‍රාහ්මී ලෙන් ලිපි 1000 කට වැඩි ප්‍රමාණයක් ලංකාවේ විවධ ප්‍රදේශවලින් ලැබී ඇත. මේවා එකම කෙනෙක් කලා යයි සිතිය නොහැක. සමාජයේ අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව පැතිරයාමත් සමග ඉන් ඇති වූ ප්‍රතිඵලයක් ලෙස මෙය පෙනී යයි. මීට සමාන තත්ත්වයක් සමකාලීන ඉන්දියාවේ පැවතුනි. උදා:- අශෝක රජු විසින් කල අශෝක ලිපි නම්. ලිපි මේ ගණයට අයත්ය. නමුත් ලංකාවේ බ්‍රාහ්මීය ලිපි වලත් අශෝක ලිපි වලත් පැහැදිලි වෙනසක් වේ. අශෝක ලිපි රජයෙන් පත්කල ධර්ම මහාමාත්‍යාදීන් නම් වූ නිලධාරීන් පිරිසක් විසින් කරවා තැනින් තැන පිහිටවූ ඒවාය. ලංකාවේ ලෙන් ලිපිවල ස්වාධීනත්වයක් දැකිය හැකිය. මේවා සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් පුද්ගලයින් අතරින් පැන නැගුණ දේවල්ය. එනිසා මෙය සමාජමය ලේඛන කලාවක් ලෙස දැක්විය හැකිය. යම් ලිපියක් යම් තැනක ලියන්නේ එය කියවීමට හැකි පිරිසක් ඇති බැවිනි. ඒ අනුව බැලූ විට මේවායේ රාජ්‍ය ලේඛනවල ඇති ප්‍රශස්ති ස්වරූපය නොව අව්‍යාජ බවක් දැකිය හැකිය. පුද්ගලයෙක් තමන් කවුද යන්නත්, තමන්ගේ තනතුරු නාමයත්, තමන් පූජා කල ලෙන හෝ ලෙන්ද සඳහන් කෙරුණි. කලාතුරකින් වැවක් ,කුඹුරක්, ඇලක් යම්කිසි මුදල් ප්‍රමාණයක් පූජා කිරීම ගැන සඳහන් වේ. ඒ අනුව මේ මුල් යුගයට අයත් සෙල්ලිපි එක්තරා විදියකට සමකාලීන සමාජය තුලින් පැන නැගුණ සමාජ සාහිත්‍යයක් ලෙස හැදින් වේ. බ්‍රාහ්මීය ලිපි සමාජයේ ස්වාධීන ලේඛන ලෙස හැඳින්විය හැකිය. වැඩි හරියක් අශෝක ලිපි ලියවී ඇත්තේ බ්‍රාහ්මී ලිපි වලිනි. ඉන්දියාවේ බටහිර නැගෙනහිර යන ප්‍රදේශවල භාවිත වූයේ බ්‍රාහ්මී අක්ෂර මාලාව වේ. ලංකාවට අශෝක යුගයේ ඒ ප්‍රදේශවලින් බුදු දහම ලැබුණු බැවින් මුලදී බොහෝ ලෙස භාවිතා වූයේ බ්‍රාහ්මී අක්ෂරය.

ලංකාවේ බ්‍රාහ්මීය අක්‍ෂර මාලාව විකාශනය වීමෙන් වර්තමානයේ පවතින සිංහල අකුරු නිර්මාණය වී තිබේ. ක්‍රි.ව. 6 ,7c වලදී මේ විකාශනය සිදු විය. මේ අක්‍ෂර විකාශනයේදී පල්ලව ග්‍රන්ථක්‍ෂර ක්‍රමයෙන්ද මනා පිටුවහලක් ලැබුණි. මේ බ්‍රාහ්මීය ලෙන් ලිපිවලින් සමකාලීන සමාජය පිළිබඳව බොහෝ දේ ඉගෙන ගැනීමට හැකිය. එකල මිනිසුන්ගේ සමාජ තත්ත්වය, ප්‍රභූත්වය දැරූ පිරිස් පිළිබඳව මිනිසුන්ගේ රැකියා පිළිබඳව ආහාර පාන පිළිබඳව මින් හඳුනාගත හැකිය. ආගමික ඉතිහාසයේදී මෙන්ම සමාජ ඉතිහාසයේදී ද මේ බ්‍රාහ්මී ලෙන් ලිපිවලින් දේශපාලන ඉතිහාසය පිළිබඳව ලැබෙන තොරතුරු අල්පය.

ලෙන් ලිපි හැරුණු විට මෙරට ඉතිහාසය හැඩ ගසා ගැනීමේදී ගිරි ලිපි, පුවරු ලිපි හා ටැම් ලිපි යන සෙල්ලිපි කාණ්ඩයන්ද වැදගත් වේ. ගිරිලිපි යනු විහාරස්ථාන, ආගමික ආයතන වැනි ස්ථානවල මහජනතාව යන එන මාර්ග අසල පර්වත බෑවුම්වල කෙටවූ ලිපියි. එමෙන්ම යම් කිසි ගල් පුවරුවක් සාදා එහි  ලිපි කොටවා සිටවීම පුවරු ලිපි ලෙස හැඳින්වේ. ටැම් ලිපි 9c පමණ සිට ජනප්‍රිය විය ගල් ටැඹක් මත සතර පැත්තෙහිම රාජඥා කොටවා තිබුණි. ටැම් ලිපිවල පමණක් නොව ගිරි හා පුවරු ලිපිවලද බොහෝ දුරට දක්නට ලැබුනේ රාජාඥා රජු නිකුත් කළ ප්‍රකාශන ප්‍රදේශ වාසීන්ට දැන ගැනීමට සැලැස්වීමයි.

පසුකාලීන යුගයේදී මුල් යුගවලදී මෙන් සමාජයේ විවිධ තරාතිරම්වල පුද්ගලයින් නිකුත් කල සෙල් ලිපි හමු නොවේ. හේතුව අක්‍ෂර ලිවීම, කියවීම පැතිරයාම නිසා තල් කොල ,වැටකේ කොළ ආදී කොළ වර්ග සාමාන්‍ය ජනතාවගේ ලිවීමේ ක්‍රමය බවට පත් විය. මේ හැර තඹ පත්තිරු, රන් පත් තීරුද රජවරු ලිවීමට භාවිතා කෙරුණි. වලගම්බා රජු අභයගිරි විහාරය පූජා කළේ කේතකී පත්‍රයකිනි.

විශාල පුවරු ලිපි **අභයගිරි** ,**ජේතවනය**, **රිටිගල**, **මිහින්තලය**, **කළුදිය පොකුණ** වැනි තැන්වලින් ලැබී ඇත. ඒවායේ විස්තර විශාල ලෙස අඩංගු වී ඇත. අනුරාධපුර යුගයට අයත් ශිලා ලිපි අතර සංස්කෘතික ලිපි ද වේ. ජේතවනාරාම සංස්කෘතික ලිපිය පුවරු ලිපියකි. මේ ලිපියෙන් ජේතවන විහාරයේ පාලන කටයුතු පිළිබඳව විස්තර වේ. පසුකාලයේ කතිකාවත් වශයෙන් හැඳින් වූ ශාසනික නීති රීති සමූහයක් අනුරාධපුර යුගයේ සමහර ශිලා ලිපි මගින් දැකිය හැකිය. ජේතවනාරාම සංස්කෘතික ලිපියද එවැනි කතිකාවතකි. කතිකාවතක් යනු භික්ෂූන්වහන්සේලාගේ පැවැත්ම උදෙසා තත්කාලීන සංඝ සමාජයට මූලික විනය නීති මාලාවක් පැනවීමයි. අභයගිරි විහාර ලිපියත් මිහින්තලේ පුවරු ලිපියත් මේ ගණයටම අයත් ලිපි ලෙස හැඳින්විය හැක.

මේ හැර සමහර ශිලා ලිපි **අධිකරණමය** තොරතුරු ලෙස වැදගත් වේ. නිදසුනක් ලෙස **කොණ්ඩවට්ටමන්** ලිපිය මගින් සමහර වැරදිවලට පනවන දඩුවම් මේ ලිපියේ සඳහන් වේ. එමෙන්ම **වේවැල්කැටිය** ලිපියද වැදගත් වේ. **සිතුල්පව්ව ශිලා ලිපිය** අනුව අධිකරණයෙන් ලබන ආදායම ප්‍රදේශයේ විහාරයට පවරා ඇත. එසේම **ගොඩවාය ටැම් ලිපියෙන්** හෙළිවන පරිදි ගොඩපවත වරායෙන් ලද ආදායම ඒ සමීපයේ තිබූ භික්ෂූ ආශ්‍රමයකට පැවරූ බව එමඟින් රජවරුන්ගේ ආදායම්

මාර්ග ගැනත් ආරාම පාලනය සඳහා එවකට රජයෙන් ලද අනුග්‍රයන් ගැනත් මේ ශිලා ලේඛනවලින් තහවුරු වේ.

**ආර්ථික** තොරතුරු ලබා ගැනීමේදී විශේෂයෙන්ම වැදගත් වන ලිපි අතර ක්‍රි.ව.4 ශතවර්ෂයට අයත් **තෝකිගල ලිපිය** වැදගත් වේ. ඒ ලිපියෙන් විස්තර කෙරෙන්නේ තෝනිගල කර තිබුණු යහිස පබ්බත නම් විහාරයේ වාර්ෂිකව පැවැත්වෙන අරියවංශ දේශනාව සඳහා සිරි මේඝවර්ණ රජුගේ ඇමතිවරයෙකු විසින් කළ පූජාවක් පිළිබඳවයි. අර්ථික අංශයේ වැදගත්වන ලිපි අතර **බදුලු ටැම් ලිපිය** වැදගත් වේ. සමකාලීනව පැවති වෙළඳාම පිළිබඳව එහි සඳහන් වේ. එමෙන්ම ඒ අසල **හෝපිටිගමුව** නමින් වෙළඳපොලක් තිබී ඇත. මේ වෙළඳ පොලේ පාලනය ගෙන ගිය ආකාරය වෙළඳ පොලට ගෙනෙන බඩුවල පැවතිය යුතු තත්ත්වය නිසි කිරුම්, මිනුම් ක්‍රම භාවිතා කිරීම, එසේ භාවිතා නොකරන අයට පමුණුවන දඬුවම්, විකිණීම සඳහා තබන භාණ්ඩ යම්කිසි මණ්ඩපයක තබා වෙළඳාම් කළ යුතුය යන්න, වෙළඳාම සඳහා ගෙනෙන භාණ්ඩ අතරමග විකිණීම තහනම්ය යන්න, අල්ලස් ගැනීම නොකල යුතුය. පෝය දිනවල වෙළඳාම් නොකල යුතුය. ආදී වශයෙන් මෙහි දක්වා ඇත. මේ හෝපිටිගමුව ලිපිය 10c වසට අයත් එකකි. ඒ වන විට ලංකාවේ වෙළඳාම දැඩි නීති -රීති පද්ධතියක් අනුව පැවතුන බව මේ ලිපි මගින් තහවුරු වේ. එමෙන්ම **පෙරියම්කුලම්** ශිලා ලේඛනය ද ආර්ථික වශයෙන් වැදගත් වේ. වෙළඳ ශ්‍රේණි හා කර්මාන්ත පිළිබඳව එහි තොරතුරු අඩංගු වේ එමෙන්ම **තිරියාය ශිලා ලේඛනයෙන්** විදේශීය වෙළඳාම ගැන කරුණු හෙළි වේ. වෙළඳ භාණ්ඩ මනින ක්‍රම වෙළඳ ශ්‍රේණි ගැන තොරතුරු එමගින් හෙළි වේ.